දිනය: 2020 අප්‍රේල් 12 යොමු අංකය: 1920-040

දයාබර දෙමාපියන් වෙත,

**<u>කොවිඩ්-19 වසංගතය ආශ්‍රිතව උද්ගතවී ඇති අර්බුදකාරී තත්වය.</u>**

2020 මාර්තු 03 දිනැති අපගේ දැන්වීම් අංක 1920-039 හා සබැඳෙයි.

වර්තමානයේ ලෝකය පුරාම ව්‍යාප්තව ඇති කොවිඩ්-19 වසංගත රෝගය ආශ්‍රිතව සෘජුවම පවතින තත්වයන් පිළිබඳව අප සියලු දෙනා බොහෝ සෙයින් දැනුවත්වී ඇති බැවින් ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කළ යුතුයැයි අප නොසිතමු. එසේවුවද, මෙම වසංගතය වක්‍රාකාරව අප ජීවන රටාව වෙත ඉතා දරුණු බලපෑම් ඇතිකර ඇති බැවින් ඒ පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීමට අදහස් කරමු.

ප්‍රථමයෙන්ම, මෙම දේශයේ පවතින තත්වයන් යටතේ දහම් පාසලේ මෙම අධ්‍යයන වසරේ ඉතිරි සති කිහිපය තුල අධ්‍යයන කටයුතු සඳහා දහම් පාසල නොපැවත්වෙන බව ඉතා කණගාටුවෙන් දැනුම් දෙමු. ඒ අනුව, මෙවර සිහිති සිංහල අවුරුදු උත්සවය, දහම් පාසලේ සංවත්සර උත්සවය, වෙසක් සිල් පිංකම සහ වෙසක් උත්සවය නොපැවත්වෙන බව කණගාටුවෙන් දැනුම් දෙමු. එසේ වුවද, අප දරුවන්ගේ දහම් පාසල් අධ්‍යාපන කටයුතුවලින් ලබාගත් අවබෝධය දරුවන්ගේ මතකයෙහි රඳවා ගැනීම උදෙසා අන්තර්ජාල තාක්‍ෂණය ඔස්සේ පවත්වන, පසුගිය පාඩම් සිහිපත් කිරීමේ වැඩපිළිවෙලක් නුදුරු අනාගතයේදීම දියත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

මෙම කොවිඩ්-19 වසංගතය නිසාවෙන් ඩුබායි දේශය තුල උද්ගතවීඇති අර්බුදකාරී සමාජ තත්වයන් අප ශ්‍රී ලාංකීක ප්‍රජාව වෙත බලපා ඇති ආකාරය පිළිබඳව යම් අවබෝධයක් ඔබ සතුව ඇතැයි සිතමු. මේ වනවිට බොහෝ ශ්‍රී ලාංකිකයන් පිරිසකගේ රැකියා අහිමිවී ඇති අතර ඉන් කොටසකට තම වාසස්ථානද අහිමිවී ඇති බව දැනගැනීමට ඇත. එසේ අසරණ වූ අපගේ නෑදැයන්ට සහ ඔවුන්ගේ දුවාදරුවන්ට තම මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය ආහාරපාන ආදිය සැපයීමට ඩුබායිහි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය විසින් පවත්වාගෙන යන්නාවූ සුබ සාධන වැඩපිළිවෙල සඳහා හැකි අයුරින් දායක වනලෙස අපගෙන් ඉල්ලීමක් කර ඇත. කොන්සල් ජෙනරාල් කාර්යාලය විසින් ප්‍රකාශිත සහන සේවා අවශ්‍ය එක් පවුලක් සඳහා සතියකට පමණ ප්‍රමාණවත් වියලි ආහාර වර්ග සහ අනිකුත් සනීපාරක්ෂක ද්‍රව්‍ය වල විස්තර පහත සඳහන් කර ඇත.

| | | | |
|---|---|---|---|
| 1. | හාල් කිලෝ 5 | 12. | මිරිස් කුඩු ග්‍රෑම් 100 |
| 2. | පරිප්පු කිලෝ 2 | 13. | කෑලි මිරිස් ග්‍රෑම් 100 |
| 3. | ලූණු කිලෝ 2 | 14. | කහ කුඩු ග්‍රෑම් 100 |
| 4. | අර්තාපල් කිලෝ 2 | 15. | තුනපහ කුඩු ග්‍රෑම් 100 |
| 5. | පිටිකිරි කිලෝ 1 | 16. | ලූණු ග්‍රෑම් 500 |
| 6. | සීනි කිලෝ 2 | 17. | සාඩින් ටින් 2 |
| 7. | තේ කොළ ග්‍රෑම් 250 පැකට් 1 | 18. | කරවල ග්‍රෑම් 500 |
| 8. | පාන් පිටි කිලෝ 2 | 19. | දන්තාලේප පැකට් 1 |
| 9. | නූඩ්ල්ස් පැකට් 1 | 20. | දත්බුරුසු 2 |
| 10. | පිටිකළ පොල්කිරි පැකට් 1 [ග්‍රෑම් 400] | 21. | සබන් කැට 2 |
| 11. | බිස්කට් ග්‍රෑම් 400 | 22. | රෙදි සෝදුම් කුඩු ග්‍රෑම් 500 |

ඉහත සදහන් වියලි ආහාර ද්‍රව්‍ය සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය සඳහන් කර ඇති ප්‍රමාණ වලින් සම්පූර්ණ කරන ලද මල්ලක මිල ඩිරාම් 135/= ක් වන අතර ඒ අනුව ආධාර මල්ලක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඔබගේ ශක්ති ප්‍රමාණයෙන් කොන්සල් ජනරාල් කාර්යාලය වෙත ලබා දෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු. එමෙන්ම, මෙම සංවේදී අවස්ථාව ඔබේ දරුවන්ට, විපතට පත්වූ අප නෑදෑයන්ගේ වේදනාව අවබෝධ කරවීම සඳහා අවස්ථාවක් කරගන්නා මෙන් මතක්කරමු. අප දරුවන්ට පවතින තත්වය පැහැදිලි කරවා, විපතේදී අන් අයට උදව් කිරීමේ ආදීනව පැහැදිලි කර, ඔබ විසින් කරන්නාවූ ද්‍රව්‍යමය පරිත්‍යාග සඳහා දරුවන්ගේ පූර්ණ දායකත්වය සහ ක්‍රියාකාරී සහභාගීවීම ලබාගන්නා ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමු.

මෙම පරිත්‍යාගයන් කිරීමට කැමති දෙමාපියන් එම ද්‍රව්‍ය සහිත මලු සකස් කරගැනීමට සහ කොන්සල් ජෙනරාල් කාර්යාලයට යැවීමට අපහසුතාවයක් තිබේනම් කරුණාකර සිසිර මහතා (050 6530329) හෝ ධම්මික මහතා (055 5557308) අමතන්න. මේ වන විට, අපගේ දූ දරුවන් වෙනුවෙන් දහම් පාසලේ දෙමාපිය අරමුදලෙන් ආධාර මලු 20 ක් අප විසින් කොන්සල් ජනරාල් කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කර ඇති බව ද සිහිපත් කරමු.

තවද, මීට සමගාමීව සහන සංවිධානය මගින්ද වියලි ආහාර ද්‍රව්‍ය බෙදාහැරීමේ ව්‍යාපෘතියක් ස්වාධීනව ක්‍රියාත්මක කර ඇති බවත් ඔබ සියලුදෙනාහට දැනුම් දීමට කැමැත්තෙමු.

එමෙන්ම, මෙම අර්බුධකාරී තත්වය නිසා අමිහිරි අභියෝගයකට ලක්වී ඇති අප දහම් පාසලේ දෙමව්පියන් සිටින්නේ නම්, ඉතා ඉක්මනින්ම කොන්සල් ජෙනරාල් කාර්යාලයට (800 119119, 055 8165747, 056 4496417, 050 2243513) හෝ සහන සංවිධානයේ ඒ සඳහා ආරම්භ කර ඇති ව්‍යාපෘති කමිටුවේ ජෝර්ජ් 050 5590911, දිනේෂ් 052 9985095, නිශාන්ත 0559702420 හෝ ඉෂ්තියාක් 052 9600045 අමතා ඔබගේ/ ඔවුන්ගේ තොරතුරු යොමුකරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

Covid-19 වසංගත තත්වය යටතේ, ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලාංකේය ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ප්‍රකාශ කර ඇති සේවාවන් පිලිබඳව දැනගැනීමට පහත සඳහන් දිගුවන් භාවිතා කරන්න.

- ශ්‍රී ලංකා කොන්සල් ජෙනරාල් කාර්යාලය
- ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
- ශ්‍රී ලංකා රජයේ මාධ්‍ය නිවේදනය
- විදේශීය ශ්‍රී ලාංකිකයන් සඳහා "ශ්‍රී ලංකාව අමතන්න" මාර්ගගත ද්වාරය. ("Contact Sri Lanka" Online Portal for Overseas Sri Lankans)

මෙම අභාග්‍ය සම්පන්න ව්‍යසනයෙන් වැලකීම සඳහා නිසි සෞඛ්‍ය හා සමාජීය වත්පිළිවෙත් අනුගමනය කරමින්, මෛත්‍රී සිතින් යුතුව කටයුතු කරමින් අපට හැකි අයුරින් විපතටපත් අප නෑදෑයනට පිහිට වෙමු. ලෝවැසි සියලුදෙනාට මෙම ව්‍යසනයෙන් ඉතා ඉක්මනින්ම අත්මිදීමට හැකිවේවායි නිතර මෛත්‍රී සිතිවිලි පතුරවමු.

සියලු දෙනාටම තෙරුවන් සරණින් හා දෙවි රැකවරණින් නිදුක් නිරෝගී සුවය ප්‍රාර්ථනා කරමු.

තෙරුවන් සරණයි!

සංවිධායක මණ්ඩලය, ඩුබායි දහම් පාසල

ඇමුණුම්:
1. තානාපති තුමාගේ මාධ්‍ය නිවේදනය
2. කොන්සල් ජනරාල් තුමාගේ පණිවිඩය

Annex 1


**Embassy of the Democratic Socialist Republic of Sri Lanka**
P.O. Box 46534
Abu Dhabi - United Arab Emirates
Tel : 00971 2 6346481 / 00971 2 6316444
Fax : 00971 2 6331661
Email : slemb.abudhabi@mfa.gov.lk

**سفارة جمهورية سري لانكا الديمقراطية الإشتراكية**
ص.ب. ٤٦٥٣٤
أبوظبي - دولة الامارات العربية المتحدة
هاتف : ٠٠٩٧١٢٦٣٤٦٤٨١ / ٠٠٩٧١٢٦٣١٦٤٤٤
فاكس : ٠٠٩٧١٢٦٣٣١٦٦١
البريد الإلكتروني : slemb.abudhabi@mfa.gov.lk


# මාධ්‍ය නිවේදනය

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ වෙසෙන ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යය මේ මොහොතේ ඉටු කරන කාර්‍යභාරය පිළිබඳව ශ්‍රී ලංකා රජය කෘතඥතාවය පළ කර සිටිමු.

.

මේ දිනවල එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පවතින තත්වයන් පිළිබඳ සමාජ මාධ්‍යයන්හි සංසරණය වන වීඩියෝ දර්ශන කිහිපයක් සම්බන්ධයෙන් තානාපති කාර්යාලයේ අවධානය යොමු වී ඇති අතර එම වීඩියෝ දර්ශනවලින් මතු කෙරෙන කාරණා සත්‍යතාවයෙන් තොර බව දැනුම් දීමට කැමැත්තෙමු.

වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීමෙන් අනතුරුව COVID 19 වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වන ශ්‍රී ලාංකිකයන් මෙරට රෝහල් හා නිරෝධායන මධ්‍යස්ථාන වෙත ගෙන යනු ලැබන අතර ඒවායෙහි පහසුකම් හා රැකවරණය යහපත් මට්ටමක පවතී.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලයේ කාර්යාලය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, මෙරට ක්‍රියාත්මකවන සුභසාධන සංවිධාන සහ අනෙකුත් ප්‍රජා හා ආගමික සංවිධානයන්හි සහය ඇතිව අවශ්‍යතා සහිත ශ්‍රී ලාංකිකයන් හට වියළි සලාක සහ අනෙකුත් ආහාර බෙදා හැරීමට කටයුතු කරනු ලැබේ.

ඔබ වෙත ලැබෙන තොරතුරු සමාජ මාධ්‍යයන්ට මුදා හැරීමට ප්‍රථම ඒවායෙහි සත්‍යතාවය ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලයෙන් තහවුරු කර ගැනීමට කාරුණික වන මෙන් ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
අබුඩාබි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය
2020 අප්‍රේල් 11

Annex 2

Consulate General of the Democratic Socialist Republic of Sri Lanka

القنصلية العامة لجمهورية سري لانكا الديمقراطية الاشتراكية

10.04.2020

ඩුබායිහි හා උතුරු එමීරයන්හි ශ්‍රී ලාංකික සංවිධාන ප්‍රධානීන් වෙත.

ආයුබෝවන්

**සමාජ සත්කාරයකට දායක වීම**

කොරෝනා වයිරස් උවදුර පැතිර යාමත් සමග ඇතිවී තිබෙන තත්වය හේතුවෙන් ඩුබායි සහ අවට එමීරයන්හි වාසය කරන ශ්‍රී ලාංකිකයන් පිරිසක් විවිධ දුෂ්කරතාවලට මුහුණපා සිටී. මෙසේ දුෂ්කර තත්වයකට පත්ව සිටින පිරිසට අත්වැලක් වීමේ අරමුණින් ඩුබායි හි කොන්සල් ජනරාල් කාර්යාලය ඔවුන් වෙත වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමින් පවතී. මෙයට සමගාමීව ඩුබායිහි ශ්‍රී ලංකා සුභසාධක (සහන) සංවිධානයද දුෂ්කරතාවයන්ට පත්ව ඇති ශ්‍රී ලාංකික ජනතාවට වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීමේ සහන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමින් පවතී.

මෙම වැඩසටහන් සඳහා ස්වේච්ඡාවෙන් දායකවූ සියළුම දෙනා හට මාගේ ස්තුතිය පුදකරන අතර ඉදිරියටත් ඔබ සංවිධානයේ සහ සාමාජිකයන්ගේ නොමසුරු දායකත්වය ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

ඔබගේ දායකත්වය පහත නිළධාරීන් මගින් සම්බන්ධීකරණය කල හැක.

**කොන්සල් ජනරාල් කාර්යාලය**

සුභාෂිනී සිල්වා මිය - 054 370 3588<br>
ප්‍රෙමෙලා ශ්‍රීකාන්තා මිය - 050 650 6162

**සහන සංවිධානය**<br>
දිනේෂ් ද සිල්වා මයා - 052 998 5095

ස්තුතියි,

නලින්ද විජේරත්න<br>
කොන්සල් ජනරාල්

P.O.Box: 51528, Dubai, U.A.E.
Tel: +971 4 3986535 Fax: +971 4 3984687

ص.ب: ، دبي – الامارات العربية المتحدة
تليفون: ٣٩٨٦٥٣٥ ٤ ٩٧١+ ، فاكس : ٣٩٨٤٦٨٧ ٤ ٩٧١+